**1). හොකී ක්‍රීඩාව ප්‍රවර්ධනය කිරීම සඳහා සෑම දිස්ත්‍රික්කයකම ක්‍රීඩාව ආරම්භ කිරීම. (වසරක් තුළ දිස්ත්‍රික් 05කට ක්‍රීඩාව හඳුන්වා දීම).**

**2). හොකී ක්‍රීඩාවේ සෑම වයස් කාණ්ඩයකම ක්‍රීඩක, ක්‍රීඩිකාවක් හඳුනා ගෙන ඔවුන්ට අවශ්‍ය පහසුකම් ලබා දීම.**

- ජාතික කණ්ඩායම් (කාන්තා හා පිරිමි) වසර පුරා පුහුණු කටයුතු පවත්වාගෙන යාම. මොවුනට අවශ්‍ය නවාතැන්, ආහාර, ක්‍රීඩා භාණ්ඩ ලබා දීම සඳහා අනුග්‍රාහක භවතුන්ගේ අනුග්‍රහය ලබා ගැනීම.
- දෙවන පෙළ සංචිත පවත්වාගෙන යාම.
- පාසල් තරඟාවලි සඳහා ශ්‍රී ලංකා පාසල් හොකී සංගමය සමඟ ගිවිසුම් ගතව අවශ්‍ය පහසුකම් සැපයීම.

**3). දැනට අක්‍රියව පවතින කෘත්‍රිම හොකී ක්‍රීඩා පිටි දෙක ක්‍රීඩාවට උචිත පරිදි පිළිසකර කිරීම හා අළුතින් උතුරු නැගෙනහිර හා දකුණු පළාත කේන්ද්‍ර කොට ගෙන කෘත්‍රිම ක්‍රීඩා පිටි 2ක් සැකසීම. (මේ සඳහා ජාත්‍යන්තර හොකී සම්මේලනයේ හා ආසියානු හොකී සම්මේලනයේ අනුග්‍රහය ලබා ගැනීමට මේ වන විට සාකච්ඡා කොට එකඟතාවයකට පැමිණ ඇත.**

**4). ශ්‍රී ලංකාවේ ප්‍රධානතම හොකී ක්‍රීඩා කරන ත්‍රිවිධ හමුදා කණ්ඩායම් සංගම් 3 ලෙස (යුධ, ගුවන්, නාවික) වශයෙන් සැකසීම. මේ තුළින් ක්‍රීඩකයින් වැඩි පිරිසකට ජාතික ශූරතාවය සඳහා තරඟ වැදීමට අවස්ථාව සළසා දීම.**

**5). සෑම සංගමයකටම තරඟාවලි පැවැත්වීමට අවශ්‍ය මඟ පෙන්වීම සහ ප්‍රතිපාදන ලබා දීම. (මෙහිදී අදාළ සංගමයේ ලියාපදිංචි වී ඇති ක්‍රීඩා සමාජ ගණන අනුව ප්‍රතිපාදන වෙන් කෙරේ).**

**6). හොකී ක්‍රීඩාවේ ප්‍රමිතිය, ජාත්‍යන්තර ශ්‍රේණිගත කිරීම මට්ටම ඉහළ නැංවීම.**

- වසර පුරා ජාතික සංචිත හා දෙවන පෙළ සංචිත වල පුහුණු සැසි පවත්වාගෙන යාම.
- S.L.H.L. ශ්‍රී ලංකා හොකී ලීග් ලෙස විදෙස් ක්‍රීඩකයින් ද සහභාගි කොට ගෙන තරඟාවලියන් පැවැත්වීම.
- විදෙස් පුහුණුකරුවන් මගින් හා ජාතික පුහුණුකරුවන්ගේ මගින් විශේෂ පුහුණු සැසි පැවැත්වීම.
- ජාත්‍යන්තර තරඟ අවස්ථා වැඩි කිරීම.
- සියළු ජාතික තලයේ ක්‍රීඩක, ක්‍රීඩිකාවන්ගේ දත්ත පද්ධතියක් සැකසීම තුළින් ඔවුන්ගේ කුසලතා මට්ටම මැන බැලීම.
- දිගුකාලීන ඉලක්කගත පුහුණු සැසි පැවැත්වීම.

**7). විනිසුරුවන් ශ්‍රේණිගත කිරීම.**

- විනිසුරුවන් A, B, C ලෙස ශ්‍රේණිගත කොට, ඔවුන්ගේ දක්ෂතා මත උසස් වීම් ලැබෙන ලෙස ක්‍රමවේදයක් සැකසීම.
- විනිශ්චය කරන තරඟවලි වල දත්ත සැකසීම.
- ජාත්‍යන්තර පුහුණු අවස්ථා ලබා දීම.

## 8). පුහුණුකරුවන් යාවත්කාලීන කිරීම.

- පුහුණුකරුවන් ලියාපදිංචි කොට, ආසියානු හා ජාත්‍යන්තර හොකී සම්මේලනයේ පුහුණු සැසි සඳහා යොමු කිරීම.
- හොකී සම්මේලනයේ ලියාපදිංචි පුහුණුකරුවන්, දිස්ත්‍රික් පළාත් වශයෙන් තෝරා ගෙන ඔවුනට පුහුකරු පත්වීම් ලබා දීම. (මේ තුළින් ක්‍රීඩාව සක්‍රීයව වසර පුරා පවත්වාගෙන යාම).

## 9). පිරිපාලනයේදී හා මෙහෙය වීමේදී විනිවිද භාවයෙන් යුත් තේරීම් නිර්ණායකයන් සැකසීම.

- සෑම ලියාපදිංචි සංගමයකටම, ශ්‍රී ලංකා හොකී සංගමයේ ව්‍යවස්ථාවේ පිටපතක් හා ලියාපදිංචි සහතිකය ලබා දීම.
- ජාත්‍යන්තර තරඟාවලි සඳහා නිළධාරීන් හා පුහුණුකරුවන් පත් කිරීම සඳහා සුදුසුකම් ලත් අතුරු කමිටු පත් කිරීම.
- ක්‍රීඩා අමාත්‍යාංශයට ලබා දිය යුතු විගණන වාර්තා හා අනිකුත් ලියකියවිලි නිසි කලකට ලබා දීම.
- විගණන වාර්තා රැස්වීම් සඳහා ඉදිරිපත් කිරීම.

## 10). ප්‍රසම්පාදන හා ටෙන්ඩර් ප්‍රදානය සම්බන්ධයෙන් රජයේ සම්මත ප්‍රසම්පාදන ක්‍රියා පටිපාටිය අනුගමනය කිරීම.

- ජාතික හා ජාත්‍යන්තර ආධාර මුදල් ලබා ගැනීමේදී හා වියදම් කිරීමේදී නිසි ක්‍රමවේදයට අනුව කමිටු තීරණ මගින් අදාළ කර්තව්‍ය ඉටු කිරීම.
- අදාළ මුදල් වියදම් කොට සති 2ක් ඇතුළත එහි අයවැය සභා සම්මත කර ගැනීම.